ගරු. රමේෂ් පතිරණ අමාත්‍යතුමනි,

ගරු. ජීවන් තොන්ඩමන් අමාත්‍යතුමනි,

ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීනි, වතු මානව සංවර්ධන භාරයේ නිලධාරීනි, ජාත්‍යන්තර රතු කුරුස සම්මේලනයේ නිලධාරීනි, වතුකරය ආශ්‍රිත නිලධාරීනි,

කීර්තිමත් අමුත්තනි,

මිතුරනි,

නමෂ්කාර්, ආයුබෝවන්, වනක්කම්

මම මෙම සුවිශේෂී අවස්ථාවේ සිංහලෙන් වචන කිහිපයක් කතා කිරීමට කැමතියි.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අසල්වැසියන් සහ මිතුරන් ලෙස බොහොම සමීපව බැඳී සිටිනවා. අපගේ ඓතිහාසික, වාර්ගික, භාෂාමය, සංස්කෘතික හා ශිෂ්ටාචාරික සබඳතා මෙම මිත්‍රත්වයේ පදනම ගොඩනගනවා. අද දේශීය පරමාදර්ශ, එකිනෙකා අතර ඇති ශක්තිමත් සබඳතා තවත් මෙම මිත්‍රත්වය ශක්තිමත් කරනවා. ඒ වගේම රාජ්‍යයන් දෙකෙහි නායකත්වයන් මෙම උත්සහායන් වෙත මග පෙන්වනවා. කොවිඩ් අභියෝග නොතකා අපට හැකි වී තිබෙනවා දෙදහස් විස්ස සැප්තැම්බර් විසි හයවන දින ගරු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාත් ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාත් අතර පැවැත්වූ අත්‍යත ද්වීපාර්ෂවික සමුළුවත්, මෙම වසරේ ජනවාරි මස සිදු වූ ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ගරු ජයශංකර් මැතිතුමාගේ සංචාරයත් ඇතුළු ඉහළ මට්ටමේ රාජ්‍ය සබඳතා පවත්වාගෙන යාමට.

මිතුරනි

ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශ්වාසනීය  මිතුරෙක්. නිවාස අංශයේ අපගේ සහාය ශ්‍රී ලංකාව සමග අප පවත්වාගෙන යන විශේෂ සබඳතාවයට නිදසුනක්. නිවාස අංශයේ නිවාස හැට තුන්දහසක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ, පනස් දහසක් නිවාස දැනට ඉදිකර අවසන්. අද මෙම අවස්ථාව එහි තවත් එක් පියවරක්. ඉන්දීය නිවාස සංවර්ධන ව්‍යාපෘතියට අමතරව අප දකුණු පළාතේ ආදර්ශ ගම්මාන එක් දහස් දෙසීයක් ඉදිකිරීමටද සහාය දක්වනවා.

මිතුරනි

ශ්‍රී ලංකාවේ, ඉන්දියාවේ සංවර්ධන ව්‍යාපෘති පදනම් වී ඇත්තේ ජලය, සනීපාරක්ෂාව, වෘත්තීය පුහුණුව, අධ්‍යාපනය යනාදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ශ්‍රී ලාංකිකයන්ගේම තේරීම් සහ ප්‍රමුඛතා මත. අපගේ ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා සිටින

සාමාන්‍ය ජනතාවගේ ජීවිත ස්පර්ශ කරනවා. මෙයට හොඳම උදාහරණය වන්නේ ඉතා සාර්ථකව ආරම්භ කරන ලද 1990 සුව සැරිය ගිලන් රථය සේවය.

2004 දී ඇති වූ සුනාමියෙන් පසුව ශ්‍රී ලංකාවේ දකුණු දුම්රිය මාර්ගය ඉන්දියානු ආධාර යටතේ නැවත ගොඩනැගූ බව මම මෙම අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. දකුණු පළාතේ හම්බන්තොට ධීවර හා ගොවි ප්‍රජාවෙන් 70,000 කට පමණ පිරිසකට ජීවනෝපාය සහය අප ලබා දුන්නා වගේම 2018 දී අපි ශ්‍රී ලංකාවේ විශාලතම විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරය මාතර රුහුණු විශ්ව විද්‍යාලයේ ලබා දුන්නා.

අපේ රටවල් දෙක අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය, මෑතකදී ශ්‍රී ලංකා මුහුදේ දී ගිනිගත් යාත්‍රාව විශාල පාරිසරික ව්‍යසනයක් සිදු නොවී නවතා ගැනීමට අපට උපකාරී වුණා. කොවිඩ් -19 වසංගත කාලය තුළ ඉන්දියාව ශ්‍රී ලංකාවට කොවිඩ් -19 වසංගතෙයෙන් සහනයක් ලබාදීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ටොන් 26 ක් වගේම ඉන්දියාවේ නිපදවන ලද එන්නත් මාත්‍රා ලක්ෂ 5 ක් ලබා දුනනා.

මිතුරනි,

ඉන්දියාව සැමවිටම ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල්කරුවෙකු වනු ඇති බව නැවත වරක් මා අවධාරණය කිරීමට කැමතියි. ඒ වගේම වලහන්දුව වතුයායේ මෙම නිවාස යෝජනා ක්‍රමයේ ආඩම්බර ප්‍රතිලාභීන්ටත් මම මෙම අවස්ථාවේ සුබ පතන්නට කැමතියි.

Thank you, නන්රි, ස්තූතියි.